www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බහුදින ධීවර යාත්‍රා හිමියන්ගේ උද්ඝෝෂනයට එරෙහිව මැර ප්‍රහාරයක්

**අපේ වාර්තා කරුවන් විසිනි.**

**2014 ඔක්තෝබර් 25**

ඉල්ලීම් කිහිපයක් මුල් කර ගනිමින් බහුදින යාත්‍රා හිමියන් සහ ඒවායෙහි වැඩ කරන ධීවරයන් විසින් 20 දා ධීවර අමාත්‍යාංශය ඉදිරිපිට පැවත් වූ සාමාකාමී උද්ඝෝෂනයට අමාත්‍යාංශය ඇතුලත සිට එල්ල කල ගල්මුල් ප්‍රහාරයකින් පස්දෙනෙක් තුවාල ලදහ. ඉන් දෙදෙනකුට රෝහල්ගතව ප්‍රතිකාර ගැනීමට සිදුවිය. ආමාත්‍යාංශය ඇතුලතින් එල්ල වූ මෙම ප්‍රහාරය ධීවර ඇමති රාජිත සේනාරත්නගේ අනුදැනුම ඇතිව කෙරුනක් බව නිසැකය. ප්‍රහාරයෙන් පසුව ජල ප්‍රහාරක රථ සහ පොලිස් කොමාන්ඩෝ භටයන් ඇතුලුව සන්නද්ධ පොලිසිය කැඳවා තිබුනි.

කල්පිටියේ සිට මීගමුව දක්වා වූ දහසක් පමන ධීවරයෝ ඊට සහභාගී වූහ. ලංකාවේ මත්ස්‍ය ආනයනය 2015 සිට නතර කිරීමට යුරෝපා සංගමය ගෙන ඇති තීන්දුව වෙනස් කිරීමට ආන්ඩුව මැදිහත් වී කටයුතු කිරීම, යාත්‍රා නිරීක්ෂන පද්ධති වෙලඳ පොලේ පවතින මිල ගනන් වලට අනුව සාධාරන මිලකට ලබාදීම, ජාත්‍යන්තර මුහුදේ මසුන් ඇල්ලීමට නීත්‍යානුකුල මුහුදු ප්‍රවේශ මාර්ගයක් ලබාදීම හා ඉන්දියානු නාවික හමුදාව විසින් අත්අඩංගුවට ගෙන ඇති ධීවරයන් හා යාත්‍රා නිදහස් කර දීම, විදේශ සමාගම් විසින් ලංකා මුහුදේ මසුන් ඇල්ලීම නතර කිරීම ඔවුන්ගේ ඉල්ලීම් වලට ඇතුලත් විය.

උද්ඝෝෂකයන්ට එරෙහිව සැලසුම් සහගත ප්‍රකෝපකරනයක් නිර්මානය කිරීමෙන් අනතුරුව ඇමති සේනාරත්න මාධ්‍ය වලට ප්‍රකාශ කලේ උද්ඝෝෂකයන් විසින් ප්‍රහාර එල්ල කිරීම නිසා අමාත්‍යාංශයේ රථ කිහිපයකට අලාභ වී ඇති බවත් පහර දුන් උද්ඝෝෂකයන් හඳුනා ගෙන ඇති බවත් ය. ඔවුන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීම සඳහා පොලිසියට පැමිනිලි කරන බවද සේනාරත්න පැවසීය. රාජ්‍ය දේපොලවලට අලාභ හානි කිරීම ඇප දිය නොහැකි වරදක් බව ද ඔහු ප්‍රකාශ කර තිබුනි.

මෙම තර්ජනය මගින් සේනාරත්න අපේක්ෂා කරන්නේ ධීවර ජනයාගේ ගැටලු විසඳා ගැනීම සඳහා කෙරෙන කවර හෝ විරෝධතා ව්‍යාපාරයක් වලකාලීමයි. මේ අතර ධීවර සංවිධාන එකමුතුව විසින් මාධ්‍ය ප්‍රකාශයක් නිකුත් කරමින් උද්ඝෝෂකයන්ට පහර දීම දැඩිලෙස හෙලා දැක ඇත.

මෙය හුදෙක් ඇමති සේනාරත්නගේ හිතුවක්කාර පිලිවෙතක ප්‍රතිඵලයක් නොවේ. එය ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ එක්සත් ජනතා නිදහස් සන්ධාන ආන්ඩුව තම ජනතා විරෝධී පිලිවෙත් වලට එරෙහිව මතුවන විරෝධය මර්දනය කිරීම සඳහා අනුගමනය කරන මැර හා පොලිස් රාජ්‍ය විධික්‍රමයන්ගේ අත්‍යන්ත කොටසකි.

ප්‍රහාරයෙන් ආන්ඩුව කෙරෙහි කුපිත වී සිටින ධීවරයන් අස්වසාලීම සඳහා ප්‍රහාරය සම්බන්ධව ඇමති සේනාරත්නගෙන් "වාර්තාවක්" කැඳවා ඇති බවත් අනතුරුව ඒ ගැන "පරීක්ෂනයක්" කරන බවත් නම් සඳහන් නොකල ආන්ඩුවේ ප්‍රකාශකයෙක් මාධ්‍යවලට කියා ඇත. ප්‍රහාරය සැලසුම් කල ධීවර ඇමතිගෙන් වාර්තා කැඳවීම හොරාගේ අම්මගෙන් පේන ඇසීමකි.

ජනාධිපති සමග සාකච්ඡාවකට අවස්ථාවක් සලසා දෙන බව ද ප්‍රදේශයේ දේශපාලන නායකයන් විසින් කියා ඇත. මෙම මැර ප්‍රහාරය සහ ධීවර ජනයාගේ ප්‍රශ්න නොතකා හැරීම හේතුවෙන් උද්ගත වී ඇති තත්වය, ජනවාරි මාසයේදී පැවැත්වීමට බලාපොරොත්තුවන ජනාධිපතිවරනයේදී අවාසිදායක ලෙස බලපානු ඇතැයි ආන්ඩුව කල්පනා කරයි. වයඹ පලාත් සභා මැතිවරනයේ දී හා ඊට පෙර පවතී මැතිවරන වලදී ජනාධිපති රාජපක්ෂ සහ ඔහුගේ ආන්ඩුවේ මැති ඇමතියන් විවිධාකාර බොරු පොරොන්දු දුන් බව ධීවරයන් විසින් මතකයට නගා ගැනීම වැදගත් ය.

ලෝක සමාජවාදී වෙබ් අඩවියට කතා කල බහුදින යාත්‍රා හිමියන් කිහිප දෙනෙක් යුරෝපා සංගමය විසින් ප්‍රකාශිත ආකාරයට එලඹෙන ජනවාරි මාසයේ සිට ලංකාවේ මාලු ආනයනය නතර කලොත් තමනට මුහන දීමට සිදුවන ගැටලු ගැන විස්තර කලහ. "සියයට 70 විතර අපේ මාලු අපනයනය කරන්නේ යුරෝපයට. ඒක නතර වුනොත් අපේ කර්මාන්තෙ මුලුමනින් ම කඩා වැටෙනවා. ආන්ඩුව සහ ධීවර ඇමතිගේ නොසැලකිල්ල නිසයි එහෙම

වෙන්නේ. බෝට්ටු නිරීක්ෂන පද්ධති සවිකිරීම යුරෝපා සංගමයේ ප්‍රධාන ඉල්ලීමක්. 2012 ඉදල යුරෝපා සංගමය ඒ ගැන අවධාරනය කරනවා. නමුත් ආන්ඩුව ඒක පැහැර හැරලා. අපි කැමතියි නිරීක්ෂන පද්ධති සවිකරන්න. එතකොට අපේ බෝට්ටු තියෙන තැන නිවැරැදිව දැන ගන්න පුලුවන්."

වෙලඳ පොලේ ලක්ෂ තුනක් පමන වන මෙම උපකරනයක් ලක්ෂ 6 ට අලෙවි කිරීමට අමාත්‍යංශය උත්සාහ කරන බවට ඔවුහු චෝදනා කලහ. "ඇමතිවරයා කොමිස් ගහල අපට වැඩි ගානට විකුනන්න හදනවා. විදේශ නැව් ඇවිල්ලා අපේ මුහුදේ මාලු අල්ලන එක අපට ලොකු අවාසියක්. චීන, තායිලන්ත නැව් ලංකාවේ කොඩිය දාගෙන අපේ මුහුදු සීමාවේ මාලු අල්ලනවා. විදේශ සමාගම් තුනක් -ටොපික්, ග්ලෝබල් සහ ජෙසී-ලංකා මුහුදු සීමාවේ මාලු අල්ලනවා. ආන්ඩුව දැනුවත්වයි ඒක කෙරෙන්නේ. ඇමතිගේ ඥාතීන්ගේ නමින් නැව් අටක් විතර තියෙනවා. සාමාන්‍යයෙන් ටූනා කිලෝ එකක් රුපියල් 800 ක් පමන ගනනකට අලවි වෙනවා. නමුත් විදේශ නැව් මාලු ගෙනාපු දවස්වලට කිලෝවක මිල රුපියල් 350-400 පත වැටෙනවා."

එක් ගමන් වාරයකට සති තුනත් මාසයත් අතර කාලයක් වැය වන බවත් තෙල්, කෑම සහ මාලුන්ට දෙන ඇම සඳහා එක්වතාවකට රුපියල් ලක්ෂ පහලොවක් පමන අවශ්‍ය බවත් බහුදින යාත්‍රා හිමියෝ පැවසූහ. ශ්‍රී ලංකාවේ බහුදින යාත්‍රා 4,000 ක් පමන ඇති අතර 30,000 පමන දෙනා ඒවායෙහි සේවය කරති. යුරෝපයට කරන අපනයනය නතර වුවහොත් පවුල් 30,000 ක ජීවිතවලට එය සෘජුව ම බලපාන බව ඔව්හු කීහ. ශ්‍රී ලංකාව 2013 වසරේ දී යුරෝපයට මාලු ටොන් 7,400 ක් අපනයනය කිරීම මගින් යුරෝ මිලියන 74 ක ආදායමක් උපයා ඇත.

ප්‍රහාරයේ දී එල්ල වූ ගල් පහරකින් දකුනු ඇසට ඉහලින් තුවාල ලැබූ 39 හැවිරිදි විවාහකයෙකු වූ සුරංග මෙසේ පැවසීයː "පවුලේ වියදම මාසෙකට 25,000 විතර යනවා. මාලු රට යවන එක නතර වෙලා රක්ෂාව නැති වුනොත් ජීවත් වෙන්න ක්‍රමයක් නැහැ." ඔහුගේ දියනිය සාකච්ඡාවට එකතු වෙමින් පැවසුවේ "ප්‍රශ්නේ සාකච්ඡා කර විසඳනවා වෙනුවට ධීවරයන් ට ප්‍රහාරයක් එල්ල කිරීම වැරදි" බවයි. ප්‍රශ්නය හැම ධීවරයාට ම බල පාන බවත්. නමුත් "ප්‍රශ්නය විසඳ ගන්න ගියහම සිද්ධ වුනේ ගල් පාරවල් කන්න බවත් ඔහුගේ බිරිඳ කීවාය. මැරයන් පහර දෙද්දී පොලිසිය ඉවත බලාගෙන සිටි බව සුරංග පැවසුවේ ය.

ලින්ටන් පෙරේරා 52 හැවිරිදි විවාහකයෙකි. ඔහුගේ දරුවන් තිදෙනොගෙන් පුතුන් දෙදෙනා ධීවරයන්ය. යුරෝපයට මාලු අපනයනය පිලිබඳ ගැටලුව නො විසඳුන හොත් තිදෙනාට ම රැකියා අහිමි වෙන බව පෙරේරා පැවසුවේය. "අපිට පිලිවෙලකට හදා ගත්තු ගෙයක්වත් නැහැ. රක්ෂාව නැති වුනොත් ගොඩ මුහුදේ මාලු අල්ලන බෝට්ටු, දැල් ආම්පන්න ගන්න අපිට සල්ලි නැහැ. අමාත්‍යංශයට ගියේ ගහ ගන්න නෙමෙයි. හරිම අසාධාරන විදිහට අපිට සැලකුවේ. මගේ දකුනු ඇහැට උඩිනුයි ගල වැදුනේ. ඇහැට වැදුනානම් ජීවිතේ ම කාලකන්නි වෙනවා. මේ ආන්ඩුවට නම් අපි චන්දෙ දෙන්නේ නැතැ" යි පෙරේරා කීවේය.

"දැන් මේ පලාතේ ඉන්න මැති ඇමතිවරු අපෙන් සමාව ගන්න හදනව. අපි කොලඹ යන බව ඒ ගොල්ලන්ට කීවා. එතකොට කිව්වේ ගිහිල්ල කාල එන්න වෙයි කියල. ඒ කියන්නේ ඒගොල්ල දැනගෙන හිටිය අපිට ගහන්න සූදානමින් ඉන්න බව." ඔහු වැඩි දුරටත් පැවසුවේ ය.

ප්‍රහාරයෙන් තුවාල ලැබූ තරංග වයස අවුරුදු 31 ක තරුනයෙකි. ගල් පහරකින් ඔහුගේ ද දකුනු ඇසට උඩින් තුවාල වී ඇත. "දුර කතනයෙන් යමෙකු කතාකර කොලඹ ඇවිත් කට උත්තරයක් දෙන්න කිව්වා. තමන් කවුද කියල කිව්වේ නැහැ. පොලිසියෙන් ද කියල හරියට ම දන්නේ නැතිව යන්නේ කොහොම ද?"

ධීවර ඇමතිට ප්‍රශ්න විසඳන්න බැරිනම් ඔහු ඉල්ලා අස්විය යුතු බව තරංග පැවසීය. "ධීවර ඇමති කතා කලේ අන්තිම කැත විදිහට. මුහුදේ දී අපට හිරහැර කරනවා. නැව්වලින් අපේ බෝට්ටු හප්පනවා. ලෝන් කපනවා. ධීවර ඇමති අපට එන්ජීඕ කාරයෝ, ජේවීපී කාරයෝ කියල චෝදනා කලා. අපි ඒ එකකටවත් සම්බන්ධ නැහැ. අපිත් එක්ක ආන්ඩු පක්ෂයේ හිටපු ප්‍රාදේශීය සභා නියෝජිතයෝ හිටිය. ඒ ගොල්ල අපි වෙනුවෙන් වචනයක් වත් කතා කලේ නැහැ."

කෙසේ වුව ද ජනාධිපති සමග සාකච්ඡාවකින් ප්‍රශ්න විසඳා ගත හැකි වෙතැයි බහුදින යාත්‍රා හිමියන්ට මිථ්‍යාවක් ඇත. "ජනාධිපතිතුමා සමග සාකච්ඡාවක් ලැබුනොත් අපට මේ ප්‍රශ්න විසඳා ගන්න පුලුවන්" යයි සමස්ත ලංකා බහුදින යාත්‍රා හිමියන්ගේ සංගමයේ ලේකම් මයාමි සමොල්කා ප්‍රකාශ කලා ය.

විදේශ සමාගම් රැකීම හුදෙක් ඇමති සේනාරත්නගේ පිලිවෙතක් පමනක් නොවේ. ඇතැම් ධීවරයන් කල්පනා කරන විදිහට ධීවර ඇමති ඉල්ලා අස්වීමෙන් ප්‍රශ්නය නොවිසඳෙන අතර ඔහු වෙනුවට පත්වන නව ඇමතිවරයා ද අනුයන්නේ මෙම පිලිවෙතම ය. මක්නිසා ද යත් එය ජාත්‍යන්තර ප්‍රාග්ධනය විසින් මෙහෙයවනු ලබන රාජපක්ෂ ආන්ඩුවේ පිලිවෙත වන බැවිනි.

© www.wsws.org